# විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින්ගේ විද්‍යුත් තොරතුරු සම්පත් භාවිතය (ජාතික පුස්තකාලය ඇසුරෙන්)

# Utilization of electronic resources of National Library by undergraduate students

**ඉරෝමි මේනකා විජේසුන්දර[1]**

**Iromi Menaka Wijesundera[1]**

## Abstract

National Library of Sri Lanka insists with large collection of quantitatively and qualitatively. Most of users are visiting the National Library for their research work and study purpose. This study examines the utilization of electronic resources of National Library by undergraduate students. This study focused a sample of 100 undergraduate students from four universities and structured questionnaires were used to collect data form the undergraduate students. The study reveals that majority of university students unaware about electronic resources available in the National Library. However, most of them were aware, how to use various electronic resources for their academic activities. The study indicated that most of the students accessed search engines to get information and they do not have awareness in using OPAC of National Library. There for the study recommends that organizing awareness programmes, workshops, modernizing electronic library facilities through proper strategic planning and giving fast internet connectivity for the users will enhance the usage of electronic resources available in the National Library.

**Keywords** – Information, Information need, Electronic Information, National Library.

*[1]පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරී,ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය*
*email: iromiwi@yahoo.com*

සාරාංශය

ජාතික පුස්තකාලයේ සම්පත් ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක වශයෙන්ද විශාල වේ. ජාතික පුස්තකාලයේ ප්‍රධානතම උපයෝජක ස්ථරයක් වන උපාධි අපේක්ෂකයින් ප්‍රධාන වශයෙන් පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු සඳහා ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය ලබාගනී. පර්යේෂණයේ දී ඉලක්කගත සංගහණය වන්නේ ජාතික පුස්තකාලයේ විද්‍යුත් තොරතුරු භාවිතා කරන මෙම විශ්වවිද්‍යාල සිසුන්ය. ඔවුන් සඳහා ප්‍රශ්ණාවලියක් ඉදිරිපත් කර එමගින් ලබාගත් ප්‍රාථමික දත්ත අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. 2018 වසරේ ජාතික පුස්තකාලය භාවිතා කළ විශ්වවිද්‍යාල හතරක උපාධි අපේක්ෂකයින් පමණක් අධ්‍යයනයට අදාල කරගනිමින් පර්යේෂණය සිදුකරන ලදී. අධ්‍යයනය මගින් පර්යේෂණ දත්ත විශ්ලේෂණය කර එමගින් උපාධි අපේක්ෂක විශ්වවිද්‍යාල සිසුන්ගේ විද්‍යුත් තොරතුරු භාවිතය පිළිබඳ තොරතුරු හඳුනාගෙන එම තොරතුරු අවශ්‍යතා ඉටු වන පරිදි ජාතික පුස්තකාල විද්‍යුත් තොරතුරු සහ සේවා නවීකරණය කළයුතු ආකාරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කර ඇත.

**මූලික පද -** තොරතුරු, විද්‍යුත් තොරතුරු, තොරතුරු අවශ්‍යතාවය, ජාතික පුස්තකාලය

**හැඳින්වීම**

තොරතුරු සම්පත් භාවිතය වර්තමාන සමාජයේ ඉතා වැදගත් සංසිද්ධියකි. බුද්ධි වර්ධනයට, මැනවින් සන්නිවේදනය කිරීමට, ආකල්ප වෙනසක් ඇතිකිරීමට මෙන්ම ගැටලුවලට පිළිතුරු සොයමින් ගත කරන අවිනිශ්චිත භාවයෙන් මිදීමට ද තොරතුරු අවශ්‍ය වේ. වර්තමාන පාඨකයා බොහෝ සෙයින් අන්තර්ජාලය වෙත නිරාවරණය වී ඇති බැවින් ඔවුන්ගේ තොරතුරු භාවිතය සහ තොරතුරු ගවේෂණ රටාවන් ද සුවිශේෂී වේ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා හදාරණ සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවල ගුණාත්මක භාවය සහ ප්‍රායෝගිකත්වය රඳා පවතින්නේ ඔවුනට පරිහරණය කිරීමට ලැබෙන තොරතුරු වල නව්‍යතාවය අනුවයි. නවතම තොරතුරු අත්පත් කරගැනීමේ දී විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර ඉතා වැදගත් වේ. ජාතික පුස්තකාලය ජාතික ඩිජිටල් පුස්තකාලය ආරම්භ කිරීම මගින් උත්සාහ කර ඇත්තේ නවතම තොරතුරු පාඨකයාට ලබාදීමයි.

ජාතික පුස්තකාල පාඨකයෝ අනෙක් පුස්තකාල පාඨකයින් හා සැසඳීමේදී වෙනස් ස්වරූපයක් ගනී. බොහෝ විට ජාතික පුස්තකාලය භාවිතා කරන්නේ පර්යේෂකයින් සහ විශ්වවිද්‍යාල සිසුන්ය. විශ්වවිද්‍යාල සිසුන්ට ප්‍රධාන සම්පත් මධ්‍යස්ථානයක් ලෙස තම විශ්වවිද්‍යාලයීය පුස්තකාලය භාවිතා කරන නමුත් ඔවුන් ජාතික පුස්තාකාලයට පැමිණෙන්නේ විශ්වවිද්‍යාල පුස්තකාලයෙන් ලබාගත නොහැකි තොරතුරු ලබාගැනීම සඳහාය. එනිසාම විශ්වවිද්‍යාල සිසුන් ජාතික පුස්තකාලයේ ප්‍රධාන උපයෝජයක ස්ථරයක් වී ඇත.

ජාතික පුස්තකාලයට පැමිණෙන පාඨකයාට, විද්‍යුත් පොත්, විද්‍යුත් සඟරා**,** මාර්ගගත උපහැරණ සහ සාරාංශ අනුක්‍රමණිකා, ශ්‍රව්‍යදෘශ්‍ය එකතුව, සූක්ෂම සේයා පටල, සූක්ෂම පත්‍රිකා, පරිගණක

දත්තපදනම්, සංයුක්ත තැටි දත්ත පදනම්, සංඛ්‍යාංකික තොරතුරු සහ, අන්තර්ජාල පහසුකම් ආදී විවිධ විද්‍යුත් තොරතුරු සම්පත් උපයෝගී කරගෙන තම තොරතුරු අවශ්‍යතා සපුරාගැනීමේ පහසුකම් සලසා තිබේ.

විශ්වවිද්‍යාල සිසුන් ගේ තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ජාතික පුස්තකාලයේ විද්‍යුත් තොරතුරුවලට ඇති හැකියාව අවබෝධ කරගැනීම පර්යේෂණයේ මූලික ඉලක්කයයි. ජාතික පුස්තකාලය සතු විද්‍යුත් සම්පත් පිළිබඳව විශ්වවිද්‍යාල සිසුන් තුළ ඇති දැනුවත් භාවය අධ්‍යයනය කිරීම, සිසුන් විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර තෝරා ගැනීම සහ ඒ ආශ්‍රිත වෙනත් සාධක හඳුනාගැනීම මෙන්ම සිසුන්ගේ විශ්වාසනීයත්වය, ප්‍රවේශ ඥානය පිළිබඳවද මෙහිදී හඳුනාගැනීමට නියමිතය. අධ්‍යයනය මගින් ඉහත ගවේශණ තොරතුරු විශ්ලේෂණය කර එමගින් ජාතික පුස්තකාල විද්‍යුත් තොරතුරු සේවා නව්‍යකරණය කළයුතු ආකාරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

**අධ්‍යයන ගැටලුව**

උපාධි අපේක්ෂකයින්ගේ විද්‍යුත් තොරතුරු අවශ්‍යතාඉටු කර ගැනීමට ජාතික පුස්තකාලයේ විද්‍යුත් තොරතුරු ප්‍රමාණාත්මකද? ජාතික පුස්තකාලය සතු විද්‍යුත් තොරතුරු පිළිබඳ විශ්වවිද්‍යාල සිසුන්තුළ ඇති දැනුවත්භාවය කෙසේද? සහ ජාතික පුස්තකාලය භාවිතයෙන් තම විද්‍යුත් තොරතුරු අවශ්‍යතාඉටුකර ගැනීමට ගන්නා උත්සාහය සාර්ථකද? යන්න මෙහි පර්යේෂණ ගැටලු වේ.

**අධ්‍යයනයේ අරමුණු**

1. විශ්වවිද්‍යාල සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා හඳුනාගැනීම
2. ජාතික පුස්තකාලය සතු විද්‍යුත් සම්පත් පිළිබඳව විශ්වවිද්‍යාල සිසුන් තුළ ඇති දැනුවත් භාවය අධ්‍යයනය කිරීම.
3. කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ලබාගැනීම සඳහා ජාතික පුස්තකාලය නව්‍යකරණය කළයුතු ආකාරය සඳහා උපක්‍රමික සැළසුම් සාකච්ජා කිරීම.

**අධ්‍යයනයේ වැදගත්කම**

මෙම අධ්‍යයනයෙන් ජාතික පුස්තකාලයේ විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර සහ ඒවායෙහි අවශ්‍යතාවයන් පැහැදිළිව අවබෝධ කරගත හැකිය. එය ජාතික පුස්තකාලයේ ඉදිරි සැලසුම් සකස් කිරීම සඳහා වැදගත් වේ. ජාතික පුස්තකාලය වැනි පර්යේෂකයින් නිතර ගැවසෙන පුස්තකාලයක පර්යේෂණ කටයුතු සඳහා ප්‍රවේශ වීම ක්‍රමවේදයන් රැසක් ඔස්සේ සිදුවේ. එහිදී

පාඨකයා ගේ ස්වාභාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ආයතනයේ ඉදිරි කටයුතු සැලසුම් කිරීමට උපකාරී වේ.

ජාතික පුස්තකාලය සතුව විද්‍යුත් තොරතුරු සම්පත් රාශියක් ඇත. මෙම සම්පත් පිළිබඳව පාඨකයා දැනුවත්ව සිටිමින් ජාතික පුස්තකාලය භාවිතා කරන්නේද නොඑසේනම් පුස්තකාලයට පැමිණ අවබෝධය ලබා ගත්තේද යන්න මෙම පර්යේෂණය මගින් හඳුනාගැනීමට හැකිය. එමගින් ජාතික පුස්තකාලය පාඨක අධ්‍යාපනය සඳහා කටයුතු කළයුතු ආකාරය පිළිබඳව මූලික අවබෝධයක් ලබාගැනීමට හැකිවේ.

ජාතික පුස්තකාලයේ විද්‍යුත් තොරතුරු පරිසරයේ සිසු ගවේෂණ හැසිරීම් පිළිබඳව සිදුකර ඇති පර්යේෂණ ඉතා සීමිතය. විශේෂයෙන් ශ්‍රී ලාංකික තොරතුරු ගවේෂණ සන්දර්භය තුළ එම හිදැස පිරවීම ද මෙම පර්යේෂණය මගින් සිදුවේ.

**අධ්‍යයනයේ සීමා**

1. 2018 වසරේ ජාතික පුස්තකාලය භාවිතා කළ විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයන් පමණක් අධ්‍යයනයට අදාල කරගැනීම.

2. විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර භාවිතා කරන විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් පමණක් තෝරා ගැනීම.

3. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හතරක් පමණක් පර්යේෂණය සඳහා තෝරාගැනීම. (කැළණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, සෞන්දර්යය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

**අධ්‍යයන ක්‍රමවේදය**

පර්යේෂණයේ දී ඉලක්කගත සංගහණය වන්නේ ජාතික පුස්තකාලය භාවිතා කරන විශ්වවිද්‍යාල සිසුන්ය. අධ්‍යයනය සිදුකරනු ලැබූ කාල පරිච්ඡේදයේ එනම් 2018 වර්ෂයේ විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර භාවිතා කරන විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් පමණක් සංගහණය ලෙස ඇතුළත් කර ඇත. සංගහණය විශ්වවිද්‍යාල සිසුන් 310 කින් සමන්විත විය.

එහිදී සරල අහඹු නියැදුම් ක්‍රමය භාවිතා කරමින් කැළණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, සෞන්දර්ය සහ කලා විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලවල සිසුන් 146 දෙනෙකු නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී. නියැදිය වශයෙන් තෝරා ගන්නා ලද්දේ තුන්වන සහ හතරවන වසරේ විශ්වවිද්‍යාල සිසුන් පමණි. ප්‍රශ්ණාවලිය සඳහා

විශ්වවිද්‍යාල සිසුන් 110 ක් ප්‍රතිචාර දක්වා තිබිණි. ඒ අතරින් අසම්පූර්ණ ප්‍රශ්ණාවලි 10 ක් වූ අතර පර්යේෂණය සඳහා ප්‍රශ්ණාවලි 100 ක් යොදාගැනිණි.

**සාහිත්‍ය ගවේෂණය**

වර්තමානයේ තොරතුරු මුද්‍රිත හා විද්‍යුත් වශයෙන් දෙමුහුන් ස්වරූපයක් ගනී. දෙමුහුන් තොරතුරු පරිසරයේ, පරිශීලක හැසිරීම තේරුම් ගැනීම සඳහා විවිධ පර්යේෂණ සිදුකරනු ලැබේ. පෙර අධ්‍යයනයන් හැදෑරීම පර්යේෂණයක සාර්ථකත්වයට හේතුවේ. එබැවින් විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂක සිසුන්ගේ විද්‍යුත් තොරතුරු අවශ්‍යතාව අරභයා සිදුකරන ලද පර්යේෂණ පිළිබඳ තොරතුරු පහත ඉදිරිපත් කෙරේ.

සමාජය තුළ තොරතුරු සංසරණයේ සුවිශාල වෙනසක් සිදුකිරීමට විද්‍යුත් තොරතුරු දායක වී ඇත. තොරතුරු සම්පත් තෝරාගැනීම, තොරතුරු ගවේෂණයේ පළමු පියවරයි. තොරතුරු මූලාශ්‍ර තෝරාගැනීමේදී විවිධ සාධක බලපායි. පරිශීලක අභිරුචිය, තොරතුරු සාක්ෂරතාවය, අරමුණු සහ පරිශීලක දැනුම ඒ අතර ප්‍රධාන කරුණු වේ. තොරතුරු තාක්ෂණයේ වර්ධනය තොරතුරු පරාසය පුළුල් කර ඇත. පරිශීලකයාට ලබාගත හැකි නව තොරතුරු මූලාශ්‍ර ලෙස අන්තර්ජාලය, සෙවුම් යන්ත්‍ර, වෙබ් පිටු, සුසංහිත තැටි, සංඛ්‍යාංක තොරතුරු ආදිය පෙන්වාදිය හැකිය (Cisse, 2004).

ඩිජිටල් තොරතුරු, විද්‍යුත් සම්පත් සහ ජාලයන් අධ්‍යයන පුස්තකාලයන්හි තොරතුරු සේවා පිළිබඳව නව පැතිකඩක් නිර්මාණය කර ඇත. සිසුන් තොරතුරු අවශ්‍යතා සඳහා ප්‍රවේශ වීමට හැකි, පහසු මාර්ගයක් ලෙස අන්තර්ජාලයට සහ ඩිජිටල් තොරතුරුවලට අවධානය යොමු කර ඇත. වැඩි සිසුන් පිරිසකට විද්‍යුත් තොරතුරු සම්පත් වලින් තොරතුරු ලබාගැනීමට හැකියාව ඇති අතර ඔවුන් බොහෝ දෙනෙක් අධ්‍යයන පැවරුම් සඳහා විද්‍යුත් සම්පත් වෙත ප්‍රවේශ වේ. (Das, 2014).

අධ්‍යාපන කටයුතු සඳහා අන්තර්ජාලය භාවිතා කිරීම දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. අන්තර්ජාලය පහසුවෙන් ප්‍රවේශ විය හැකි අසීමිත තොරතුරු ප්‍රමාණයකින් සමන්විත වේගවත් සන්නිවේදන ජාලයකි. අධ්‍යාපන ප්‍රභවයක් ලෙස, අන්තර්ජාලය භාවිතා කරන්නන්ට එය ඵලදායි ලෙස භාවිතා කිරීම සඳහා නිශ්චිත දක්ෂතා අවශ්‍ය ය. වර්තමාන ඩිජිටල් පරම්පරාව ඉගෙනුම් අරමුණු සඳහා ද අන්තර්ජාලය භාවිතා කරයි. (Meena and Sadhana, 2017).

සිසුන් රාක්කවල පොත්වලින් මෙන්ම අන්තර්ජාලයෙන්ද තොරතුරු සොයති. සමහර අවස්ථාවලදී පුස්තකාල විද්‍යුත් දත්ත සමුදායන් භාවිතා කරති. ගවේෂණ ක්‍රමෝපායන් සකස් කිරීම හා පුස්තකාල විද්‍යුත් සම්පත් භාවිතය පිළිබඳව සිසුන් පුහුණු කිරීම අවශ්‍ය වන්නේ ශිෂ්‍යයින් කලාතුරකින් ගවේෂණ උපාය මාර්ගයන් භාවිතා කිරීම නිසාවෙනි. ගවේෂණ ක්‍රම

වෙනුවට සෙවුම් යන්ත්‍රවල දිගු වාක්‍ය යතුරු ලියනය කිරීම දක්නට ලැබේ. (Uugwanga, 2017). ශිෂ්‍යයින් තොරතුරු ගවේෂණය සඳහා සෙවුම් යන්ත්‍ර, විශේෂිත දත්ත පදනම් සහ සම්පූර්ණ පෙළ සහිත විද්‍යුත් සම්පත් භාවිතා කරති. සීමිත පුහුණු අවස්ථා, තොරතුරු ගවේෂණ ක්‍රමවේදයන් පිළිබඳ නොදැනුවත්කම සහ ඉංග්‍රීසි භාෂා දැනුම දුර්වල වීම විද්‍යුත් තොරතුරු ගවේෂණයේදී සිසුන් මුහුණ දෙනපොදු ගැටලු විය. (Premarathne, 2017).

සිසුන් සිය අධ්‍යයන කාර්යයන් සඳහා විද්‍යුත් තොරතුරු භාවිතා කළ අතර විද්‍යුත් තොරතුරු වෙත ප්‍රවේශ වීම සහ තොරතුරු ගවේෂණය සම්බන්ධ දැනුම, අත්හදා බැලීම් සහ වැරදීම් ඔස්සේ තමන් විසින්ම ලබාගත් බවයි. පුස්තකාලය විසින් විද්‍යුත් තොරතුරු පිළිබඳව කරන ලද දැනුවත් කිරීම් සම්බන්ධයෙන් පරිශීලකයන්ගේ අවබෝධය අල්ප බව වේ. (Jazeel & Dehigama. 2017).

විශ්වවිද්‍යාල සිසුන්ට පුස්තකාල වෙබ් පිටු, විවෘත ප්‍රවේශ ක්‍රම, සහ පුස්තකාලය මගින් ලබාගත හැකි විද්‍යුත් තොරතුරු පිළිබඳව අවබෝධයක් නොමැත. එසේම සිසුන් බහුතරයක් විද්‍යුත් තැපැල, මුහුණු පොත සහ ක්ෂණික පණිවුඩ මගින් සන්නිවේදනයට කැමැතිය. තම තොරතුරු අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා විශ්වවිද්‍යාල සිසුන් අන්තර්ජාල තොරතුරු සමග සමගාමීව කටයුතු කරන බව පර්යේෂණ ප්‍රතිඵල මගින් තහවුරු වේ. විද්‍යුත් පරිසරයේ තොරතුරු ගවේෂණ හැසිරීම ඉහළම සාධනීය සංගුණක පෙන්නුම් කරන අතර විශ්වවිද්‍යාල සිසුන්ට ඔවුන්ගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කරගැනීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කළ යුතු ය (Dayarathna & Munasinghe, 2014).

උපාධි අපේක්ෂකයෝ විශේෂයෙන් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීම සඳහා විවිධාකාර තොරතුරු මූලාශ්‍ර පරිශීලනය කරති. තොරතුරු ගවේෂණය පරිශීලකයාගේ අරමුණු, සාක්ෂරතාවය, පර්යේෂණ අවශ්‍යතා, සුවිශේෂී තොරතුරු ගවේෂණ හැකියාවන්, තොරතුරු භාවිතය සහ හැසිරීම මත සිදුවේ. පරිපූර්ණ ගවේෂණයකදී විද්‍යුත් තොරතුරුවල වටිනාකම බොහෝය. සංකීර්ණ අධ්‍යයන කටයුතු වලදී සාම්ප්‍රදායික තොරතුරු සම්පත් වැඩි භූමිකාවක් ඉටුකරයි. නමුත් සිසුන්ගේ සහයෝගීතා කර්තව්‍යයන්හිදී ලේඛන හුවමාරු කරගැනීමට ඇති පහසුකම් සලකා බලන අතර එහිදී විද්‍යුත් තොරතුරු සම්පත් භාවිතය සඳහා යොමුවීමක් පෙන්නුම් කරයි. පුස්තකාල කාර්ය මණ්ඩලය බහුවිධ කුසලතා වලින් පූර්ණව සිටීම විද්‍යුත් පරිසරයේදී තොරතුරු ගවේෂණ ප්‍රතිඵල සාර්ථක වීමට බෙහෙවින් බලපායි (Gakibayo et al., 2013).

අන්තර්ජාල තොරතුරුවල නිරවද්‍යතාවය කෙරෙහි සිසුන් අතර යම් ව්‍යාකූලත්වයක් ඇතත් ඔවුන් වැඩි පිරිසක් විශ්වාසය තබා ඇත්තේ ද සෙවුම් යන්ත්‍ර මත වේ. අන්තර්ජාල ගවේෂණ මගින් නිබන්ධන සැකසීමේදී ඒ හා සම්බන්ධ පර්යේෂණ ඇගයුම් ප්‍රමාණවත් නැත. ඔවුන්ගේ පර්යේෂණ ලිපි අධ්‍යයනයකදී හෙළිවී ඇත්තේ සිසුන් වැඩි වශයෙන් උපුටා ගැනීම් සිදුකර ඇත්තේ විද්‍යුත්සඟරා සහ දත්ත පදනම් වලින් බවයි.

වසර ගණනාවක සිසු නිබන්ධන හැදෑරීම මගින් සහ මුද්‍රිත තොරතුරු සංසරණය මගින් සිසුන් සාම්ප්‍රදායික තොරතුරු මත තබා ඇති විශ්වාසය අවම වී ඇති බව සොයාගෙන ඇත. ඔවුන් සාම්ප්‍රදායික තොරතුරු මූලාශ්‍රවලින් ක්‍රම ක්‍රමයෙන් ඉවත් වීමත් සමග විද්‍යුත් තොරතුරු කෙරෙහි වැඩි විශ්වාසය තබා ඇති බව පර්යේෂකයා සටහන් කරයි. නවතම තොරතුරු වෙත ලඟාවීමේ පහසුම මාර්ගය විද්‍යුත් තොරතුරු ලෙස හඳුනාගෙන ඇති සිසුන් වාර සඟරා වැඩි වශයෙන් භාවිතා කර ඇති බවද කියයි. පර්යේෂණය මගින් පර්යේෂකයා පෙන්වා දීමට උත්සාහ කරන්නේ විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂයකයින්ගේ අනාගත අධ්‍යයන අවශ්‍යතා වෙනුවෙන් පුස්තකාලවල කටයුතු යම් වෙනසකට ලක්විය යුතු බවයි (Mill, 2008).

ශිෂ්‍යයා තොරතුරු ගවේෂණය සඳහා වැඩි මනාපයක් දක්වා ඇත්තේ මුද්‍රිත මාධ්‍යයට වඩා විද්‍යුත් ඍජු තොරතුරු මූලාශ්‍ර භාවිතා කිරීමට බවයි. සෙවුම් යන්ත්‍රය ශිෂ්‍යයින් විසින් බහුල ලෙස භාවිතා කරන අතර විද්‍යුත් සඟරා සහ මාර්ගගත සුචි ද භාවිතා කරනු ලැබේ. විද්‍යුත් තොරතුරු සඳහා ප්‍රවේශය ලබා ගැනීමේදී ඒවා දක්වන කාර්යක්ෂමතාවය සිසුන් අගය කර ඇත. වේගවත් සන්නිවේදනය, තොරතුරු හුවමාරු කිරීම පහසුවීම, අන්තර්ගතයේ පරිපූර්ණභාවය හා භාවිතයේ සරලත්වය සමබරව සම්බන්ධ වී ඇති අතර ඉතා ඉක්මණින් සන්නිවේදනය, තොරතුරු හුවමාරු කිරීම හා පරිහරණය කිරීම පහසු වීම ද පරිශීලකයාගේ විද්‍යුත් තොරතුරු නැඹුරුතාව වර්ධනය කර ඇත. ගවේෂණ ක්‍රමෝපායයන් පිළිබඳව අවබෝධය මඳ වීම නිසා තොරතුරු අවශ්‍යකරන කාලසීමාවේ දී සිය අවශ්‍යතාවය ඉටු කරගත නොහැකි බවත් මෙම අභියෝගයන් ජය ගැනීමට සහ නීතිමය තොරතුරු මූලාශ්‍ර හා සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා ජංගම තාක්ෂණය, ක්ෂණික පණිවුඩකරණ සේවාව, විද්‍යුත් තැපැල් පණිවුඩ සේවාව ආදිය මගින් පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථාන ඒකාබද්ධ කිරීම උපකාරී විය හැකිය. තොරතුරු සාක්ෂරතාවය, මාර්ගගත ගවේෂණ පිළිබඳ පුහුණු වැඩසටහන්, පුස්තකාල සහ අනෙකුත් නෛතික ආයතන විසින් කලින් කලට සංවිධානය කළ යුතුය. මේ අනුව මෙම අධ්‍යයනය මගින් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා අනුගමනය කළ හැකි උපාය මාර්ග ඇත (Das & Jadab, 2017).

විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයෝ බොහෝ විෂම විෂයක්ෂේත්‍රයන් තුළ සිය පර්යේෂණ කටයුතු සිදුකරති. කිසියම් තොරතුරක් ගවේෂණය කිරීම සඳහා ඔවුන්ගේ ක්‍රමෝපාය වන්නේ අතිශය සංකීර්ණ සහ විශේෂිත දත්ත සමුදායන් සොයමින් සැරි සැරීමයි. ඔවුහු සිය ගවේෂණ කටයුතුවල කාර්යක්ෂමතාවය ඉහළ නංවාගැනීම සඳහා පරිගණකය මත පදනම්වූ තොරතුරු සම්පත් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරති.

## 04. දත්ත විශ්ලේෂණය

පර්යේෂණයේ දී ඉලක්කගත සංගහණය වන්නේ ජාතික පුස්තකාලයේ විද්‍යුත් තොරතුරු භාවිතා කරන විශ්වවිද්‍යාල සිසුන්ය. ඔවුන් සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර එමගින් ලබාගත් ප්‍රාථමික දත්ත අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. මෙහිදී විශ්වවිද්‍යාල හතරක සිසුන් පමණක්

මෙම නියැදියට ඇතුළත් කර ඇත. සම්පූර්ණ කර ලබාදෙන ලද ප්‍රශ්ණාවලි 100 ක් ඇසුරෙන් දත්ත විශ්ලේෂණය සිදුකරන ලදී.

වගුව 4. 1 - **විශ්වවිද්‍යාල සිසුන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම පිළිබඳව අවබෝධය (සංඛ්‍යාත්මක වශයෙන්** )

| **තත්ත්වය** | **සිසුන් සංඛ්‍යාව** |
|---|---|
| ඉතා ඉහළයි | 23 |
| ඉහළයි | 31 |
| සාමාන්‍යයයි | 46 |
| එකතුව | 100 |

විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින්ගේ තොරතුරු තාක්ෂණ දැනුම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම වගුව 4.1හි අරමුණ විය. සමීක්ෂණ ප්‍රතිඵල අනුව ඉතා ඉහළ මට්ටමක තොරතුරු තාක්ෂණික දැනුම සහිත සිසුන් ප්‍රමාණය සංඛ්‍යාත්මකව 23කි. ඉහළ මට්මමේ දැනුම සහිත සිසුන් ප්‍රමාණය 31ක් වූ අතර සාමාන්‍ය දැනුමකින් යුත් සිසුන් ප්‍රමාණය 46ක් විය.ඒ අනුව ඉහළ තොරතුරු තාක්ෂණ දැනුම සහිත සිසුන්ගේ ප්‍රතිශතය 23% කි.ඉහළ මට්ටමේ දැනුම සහිත ප්‍රමාණය 31% ක් වන අතර සාමාන්‍ය මට්ටමේ දැනුම සහිත ප්‍රමාණය 46% කි.

වගුව **4.2**- **ජාතික පුස්තකාලය භාවිතා කරන සිසුන්ගේ විද්‍යුත්තොරතුරු මූලාශ්‍ර පිළිබඳව අවබෝධය**

| **විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර පිළිබඳව අවබෝධය** | **සිසුන් සංඛ්‍යාව** |
|---|---|
| ඉහළ අවබෝධයක් ඇත | 51 |
| සාමාන්‍ය අවබෝධයක් ඇත | 49 |
| එකතුව | 100 |

4.2 වගුවට අනුව සිසුන් 51 දෙනෙකුට විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර පිළිබඳව ඉහළ අවබෝධයක් ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 51%කි. සිසුන් 49 දෙනෙකුට ඇත්තේ සාමාන්‍ය මට්ටමේ අවබෝධයකි. එය ප්‍රතිශතයක් ලෙස සැළකීමේදී 49% කි.

**වගුව 4.3 ජාතික පුස්තකාල සහ ජාතික පුස්තකලය සතු විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර පිළිබඳව අවබෝධය**

| **ජාතික පුස්තකාලය පිළිබඳව අවබෝධය** | **සතුටුදායකයි** | **අසතුටුදායකයි** | **එකතුව** |
|---|---|---|---|
| ජාතික පුස්තකාලය පිළිබඳව ඇති අවබෝධය | 81 | 19 | 100 |
| පුස්තකාල සතු විද්‍යුත් තොරතුරු සම්පත් පිළිබඳ අවබෝධය | 28 | 72 | 100 |

ජාතික පුස්තකාලය සහ එහි ඇති විද්‍යුත් තොරතුරු සම්පත් පිළිබඳව සිසුන්ගේ අවබෝධය විමසා බැලීම පර්යේෂණයේ එක් අරමුණක් විය. වගුව 4.3 ට අනුව ජාතික පුස්තකාලය පිළිබඳව අවබෝධය සතුටුදායක මට්ටමක ඇති පිරිස 81දෙනෙකි. සතුටුදායක නොවන පිරිස 19 දෙනෙකි. එසේ වුවද ජාතික පුස්තකාලය සතු විද්‍යුත් සම්පත් පිළිබඳව ඇති අවබෝධය විමසා බැලීමේදී වෙනස් ආකාරයක ප්‍රතිඵයක් දැකගන්නට ලැබිණි. එනම් විද්‍යුත් තොරතුරු සම්පත් පිළිබඳ දැනුම සතුටුදායක මට්ටමේ ඇති පිරිස 28 දෙනෙකු පමණක් වන විට අසතුටුදායක මට්ටමේ ඇති පිරිස 72 දෙනෙකු තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

**වගුව 4.4 - සිසුන් තොරතුරු ගවේෂණයේදී ප්‍රථමයෙන්ම භාවිතා කිරීමට තෝරාගන්නා මූලාශ්‍රය**

| **මූලාශ්‍රය** | **සිසුන් සංඛ්‍යාව** |
|---|---|
| මාර්ගගත පොදු ප්‍රවේශ නසුචිය | 33 |
| සෙවුම් යන්ත්‍ර | 56 |
| දත්ත පදනම් | 10 |
| සංයුක්ත තැටි | 01 |
| එකතුව | 100 |

සිසුන් තොරතුරු ගවේෂණය කිරීමේදී ප්‍රථමයෙන්ම තෝරාගන්නා මූලාශ්‍රයන් පිළිබඳව සංඛ්‍යාලේඛන වගුව 4.4 මගින් පෙන්වා දී ඇත. ඒ අනුව බහුතර සිසුන් පිරිසක් එනම් 56 දෙනෙකු පමණ සිය පළමු ගවේෂණ මූලාශ්‍රය ලෙස සෙවුම් යන්ත්‍ර භාවිතා කරන බව පෙනේ. මාර්ගගත පොදු ප්‍රවේශන සූචිය ප්‍රථමයෙන් භාවිතා කිරීම සඳහා සිසුන් 33 දෙනෙකු යොමුවී ඇත. දත්ත පදනම් පළමුවෙන්ම භාවිතාකර ඇත්තේ සිසුන් 10 දෙනෙකු පමණි. සංයුක්ත තැටි මගින් තොරතුරු ගවේෂණය ආරම්භ කරන සිසුන් ප්‍රමාණය ඉතා අවම අගයක් ගන්නා අතර එය එක් සිසුවෙකුට සීමා වී තිබේ.

**වගුව 4.5 - තොරතුරු ගවේශණයේදී විශ්වවිද්‍යාල සිසුන්ගේ විද්‍යුත් මූලාශ්‍ර භාවිතය**

| **මූලාශ්‍රය** | **භාවිතය** |
|---|---|
| විද්‍යුත් විමර්ශන මූලාශ්‍ර | 48 |
| සංයුක්ත තැටි | 36 |
| දත්ත පදනම් | 53 |
| විද්‍යුත් පොත් | 8 |

විශ්වවිද්‍යාල සිසුන් තම විද්‍යුත් තොරතුරු අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා භාවිතා කරන තොරතුරු මූලාශ්‍ර වර්ගයන් පිළිබඳව වගුව 4.5 මගින් පැහැදිලි කෙරේ. මේ සඳහා ජාතික පුස්තකාලය සතු විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර කිහිපයක් පමණක් යොදාගන්නා ලදී. සංඛ්‍යාලේඛන අනුව විද්‍යුත් විමර්ශන මූලාශ්‍රයන් භාවිතා කරන සිසුන් ප්‍රමාණය 48කි. සිසුන් 36 දෙනෙකු සංයුක්ත තැටි භාවිතා කොට ඇති අතර සිසුන් 08 දෙනෙකු පමණක් විද්‍යුත් පොත් භාවිතා කර ඇත. බහුතර සිසුන් සංඛ්‍යාවක් එනම් සිසුන් 53 දෙනෙකු දත්ත පදනම් භාවිතය මගින් සිය තොරතුරු අවශ්‍යතාවයන් සපුරාගෙන ඇත.

**වගුව 4.6 - විද්‍යුත් තොරතුරු ගවේෂණය සහ සිසු අධ්‍යයන කාර්ය සාධනය**

| **ජාතික පුස්තකාලයේ දී විද්‍යුත් තොරතුරු අවශ්‍යතාව උපරිම මට්ටමින් සම්පූර්ණ වූයේ ද ?** | **ඔව්** | **නැත** | **එකතුව** |
|---|---|---|---|
| සිසුන් ප්‍රමාණය | 54 | 46 | 100 |

ජාතික පුස්තකාලය සතු විද්‍යුත් තොරතුරු භාවිතා කොට තම අධ්‍යයන කටයුතු සඳහා උපරිම දායකත්වය ලබාගැනීමට හැකි වූ බව පවසා ඇත්තේ සිසුන් 54 දෙනෙකු පමණි. සිසුන් 46 දෙනෙකුම ජාතික පුස්තකාලය ආශ්‍රයෙන් තමන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීමට අසමත්ව ඇත.

**5.1 නිගමන**

උපාධි අපේක්ෂක සිසුන් තොරතුරු තාක්ෂණ දැනුම සහිත විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර පිළිබඳ අවබෝධයක් සහිත සිසුන් බව අධ්‍යනයෙන් හෙළිවේ. උපාධි අපේක්ෂක සිසුන්ගේ යාවත්කාලීන තොරතුරු අවශ්‍යතාවලට විසීම සඳහා අවශ්‍ය ප්‍රාථමික, ද්විතීය හා තෘතියික තොරතුරු මූලාශ්‍රවලින් යුත් විද්‍යුත් ආකෘතියට ඇතුළත් වන විවිධ විද්‍යුත් තොරතුරු ප්‍රභවයන් රැසක් ජාතික පුස්තකාලය සතුව පවතී. ජාතික පුස්තකාලය සතු ප්‍රධාන තොරතුරු සම්පතක් ලෙස විද්‍යුත් සම්පත්වලට ප්‍රමුඛත්වය ලබාදීමක් සිදුවන අතර එහි භාවිතය සහතික කිරීම සඳහා විවිධ පියවර ගෙන ඇත. එසේ වුවද ජාතික පුස්තකාලය සතුව තිබෙන මෙම විද්‍යුත් තොරතුරු සම්පත් පිළිබඳව විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් තුළ ඇති දැනුවත්භාවය ප්‍රමාණවත් නොවන බව පර්යේෂණ වාර්තා තහවුරු කරයි. විද්‍යුත් මාධ්‍ය සම්පත් සිසුන් විසින් උපරිමයෙන් ප්‍රයෝජනයට නොගැනීමට මේ කරුණ හේතුවන බව පෙනේ. ජාතික පුස්තකාලය පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබා දෙන පාඨක අනුස්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක වුවද විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර පිළිබඳව එහිදී පූර්ණ අවබෝධයක් ලබාගැනීමට අවස්ථාවක් ලැබී නොමැත. අධ්‍යයනයෙන් හෙළිවූ කරුණු අනුව විශ්වවිද්‍යාල සිසුන් තොරතුරු මූලාශ්‍ර වෙත පිවිසීම සඳහා සෙවුම් යන්ත්‍ර භාවිතා කිරීමට වැඩි ප්‍රමුඛතාවයක් ලබාදෙන බව පෙනෙන්නට තිබේ. මුරපද නොමැතිවීම සහ ගවේෂණ ප්‍රතිඵල පුළුල් වීම එයට හේතු වූවා විය හැකිය. සිසුන් තම තොරතුරු අවශ්‍යතා සපුරාගැනීම සඳහා භාවිතා කරනු ලබන විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර පිළිබඳව කරනු ලැබූ සමීක්ෂණය සඳහා යොදාගන්නා ලද්දේ ජාතික පුස්තකාලය සතුව පවතින තෝරාගත් මූලාශ්‍ර කිහිපයකි. ඒ අතරින් වැඩිම සිසුන් පිරිසක් තම විද්‍යුත් තොරතුරු අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා දත්ත පදනම් භාවිතා කළ බව දැකගත හැකිය. තොරතුරු අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම තුළින් පෙනීයන්නේ ජාතික පුස්තකාලය තම විද්‍යුත් තොරතුරු එකතුව ගොඩනැංවීමේදි පාඨක රුචිකත්වය සහ පාඨක අවශ්‍යතාවය පිළිබඳව සැලකිළිමත්වී නොමැති බවයි. විධිමත් විද්‍යුත් එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් නොමැතිවීම කාර්යක්ෂම සහ ඵලදායි තොරතුරු සේවාවක් පවත්වාගෙනයාමට අහිතකර බලපෑම් එල්ලකර තිබේ. පාඨක රුචිය සහ පාඨක අවශ්‍යතා පිළිබඳව කරනලද සමීක්ෂණයන්හි වාර්තා සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමුකොට නැති බවද කිවයුතුය.

**5.2 නිර්දේශ**

1. විද්‍යුත් තොරතුරු පිළිබඳව අවබෝධය ලබාදියහැකි අනුස්ථාපන වැඩසටහන් මගින් පාඨකයින් දැනුවත් කිරීම

ජාතික පුස්තකාලය සහ එය සතු විද්‍යුත් තොරතුරු පිළිබඳව පැහැදිළි අවබෝධයක් විශ්වවිද්‍යාල සිසුන් තුළ නොමැතිබව පර්යේෂණයේ ප්‍රතිඵල අනුව නිගමනය කළ හැකි බැවින් ඒ පිළිබඳව අවබෝධය ලබාදිය හැකි ක්‍රියාමාර්ග සැළසුම් කොට ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. මානව සම්බන්ධතා, දැන්වීම්, අත් පත්‍රිකා වැනි සම්ප්‍රදායික ප්‍රචාරක උපක්‍රම මෙන්ම youtube, සමාජ මාධ්‍ය ජාල, බ්ලොග් වැනි නූතන ශිෂ්‍ය ප්‍රජාව ආකර්ශණය කර ගත හැකි තාක්ෂණික උපක්‍රම මේ සඳහා භාවිතා කළ හැකිය.

2. එකතු කළමනාකරණ ප්‍රතිපත්ති සහ උපායමාර්ගික සැළසුම් සම්පාදනය තුළින් නවීකරණ කටයුතු සැලසුම් කිරීම

පර්යේෂණයේ සමස්ත ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම මගින් නිගමනය කළ හැකි වන්නේ ජාතික පුස්තකාලය විශ්වවිද්‍යාල සිසුන්ගේ විද්‍යුත් තොරතුරු අවශ්‍යතා පූර්ණ ලෙස ඉටුකිරීමට අපොහොසත්වී ඇති බවයි. මෙම තත්ත්වය මඟහරවා ගැනීම පිණිස උපායමාර්ගික සැලසුම් සහ එකතු කළමනාකරණ ප්‍රතිපත්ති නැවත සකස් කොට ක්රියාත්මක කිරීම අවශ්‍ය වේ. ජාතික පුස්තකාලය සතුව ඇත්තේ අවිධිමත් විද්‍යුත් තොරතුරු එකතුවකි. පාඨකයා මුහුණදෙන යම්යම් ගැටලු අවම කිරීමට නම් පුස්තකාලය සතු විද්‍යුත් තොරතුරු එකතුව විධිමත් කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.

3. යාවත්කාලීන තොරතුරු එකතුවක් පවත්වාගැනීම

තොරතුරු අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට අපොහොසත්වීම තුළින් පෙනීයන්නේ පාඨකයින් වෙත සපයන සේවය පිළිබඳව ඔවුන් සෑහීමකට පත් නොවන බවයි. වේගවත් තොරතුරු හුවමාරුවට සහ බාගත කිරීමට සුදුසු පරිදි අන්තර්ජාල සහ පරිගණක පහසුකම් වැඩිදියුණු කිරීම මෙන්ම නව තොරතුරු පුස්තකාලයට එකතු කර ගැනීම කෙරෙහිද මෙහිදී අවධානය යොමු කළ යුතුය.

සමස්තයක් වශයෙන් ගත්කළ විශ්වවිද්‍යාල සිසුන් විද්‍යුත් තොරතුරු සහ තොරතුරු ගවේෂණ ක්‍රම පිළිබඳව දැනුවත්ය. එබැවින් පාඨක අවශ්‍යතාවයන්ට අනුගත වූ සැළසුම් සකස්කොට ක්‍රියාත්මක කළ හැකි නම් ජාතික පුස්තකාලය දරණ පිරිවැය සහ එහි කාර්යමණ්ඩලය වැය කරන ශ්‍රමය සිය පාඨක ප්‍රජාවගේ අවශ්‍යතාවයන්ට සහ රටේ ඉදිරි ගමනට අනභිභවනීය දායත්වයක් සපයනු ඇත.

## References

Cisse C (2004). Access to electronic information and information research. SCALWA Newsletter 5(1): 14-17.

Das, A. K. 2014. Information needs and seeking habits of engineering students on the digital environment: a study. *Journal of Information Management*, 1(2): 127-138. Retrieved from http://splpjim.org/wp-content/uploads/2016/04/Article-7.pdf

Das, Rajesh Kumar, and Jadab, Anwesha. (2017). Patterns of Information Seeking Behaviour of Law Students in Digital Environment: A Study. *Journal of Information Science Theory and Practice*, 5(1), 15–25. https://doi.org/10.1633/JISTAP.2017.5.1.2

Dayarathna, C.K and Munasinghe, P. G. (2014). Information Seeking Behavior of Undergraduates of Sri Lanka in Digital/Online Environment. *Proceedings of Second Annual Research Conference – 2013 on the Emergence of "Novelty in Business Management", South Eastern University of Sri Lanka*, pp 233-238, Faculty of Management and Commerce, South Eastern University of Sri Lanka . Retrieved from http://ir.lib.seu.ac.lk/handle/123456789/600

Gakibayo, Anna, Ikoja-Odongo, J. R., and Okello-Obura, Constant (2013). Electronic information resources utilization by students in mbarara university library. *Library Philosophy and Practice*, 869. Retrieve from https://digitalcommons.unl.edu/libphilprac/869

Jezeel, M.I.M. and Dehigama, K. (2016). Usage and awareness of EIRs by the Islamic studies and Arabic language students at South Eastern University of Sri Lanka. Paper presented at South Eastern University Arts Research Sessions, Oluwil, Sri Lanka. Retrieved from http://ir.lib.seu.ac.lk/handle/123456789/2197

Mill, D. H. (2008). Undergraduate Information Resource Choices. *College & Research Libraries*, 69(4), 342–355. doi: http://doi.org/10.5860/crl.69.4.342

Meena Prakash Kute, and Sadhana Pote-Palsamkar (2017). A study of relationship between internet usage and self-regulated learning of undergraduates. *International Journal of Research - Granthaalayah*, 5(4), 32-40. doi: http://doi.org/10.5281/zenodo.569477

Premarathne, S. (2017). Use of electronic information resources by arts undergraduates during the preparation of final year dissertations: a study at University of Peradeniya. *Journal of the University Librarians Association of Sri Lanka*, 20(2):59–69.doi: http://doi.org/10.4038/jula.v20i2.7901

Uugwanga, N. S. T. (2017). *Information-seeking behaviour of Faculty of Agriculture and Natural Resources' students at Neudamm Campus, University of Namibia*. (Thesis). University of Cape Town , Library and Information Studies Centre (LISC). Retrieved from http://hdl.handle.net/11427/26201

Wijetunge, P. (2015). Information-seeking Behaviour and Issues of Agriculture Undergraduates of University of Peradeniya. *Journal of the University Librarians Association of Sri Lanka*, 18(2), pp.1–25.doi: http://doi.org/10.4038/ jula.v18i2.7863

Wijetunge, P. and Peiris, N.D. (2017). Digital information resources preferences and evaluation criteria used by the final year engineering undergraduates: a case study. *Journal of the University Librarians Association of Sri Lanka*, 20(1):19-38. doi: http://doi.org/10.4038/jula.v20i1.7894